**Examinations Division**
**University of Kelaniya**

ගරු ස්වාමීන් වහන්ස/මහත්මයාණෙනි/මහත්මියනි, මෙනෙවියනි,

**"අනුපස්ථිතියෙහි" උපාධිය ප්‍රදානය කිරීම.**

විශ්වවිද්‍යාලය මගින් වරින් වර අවස්ථා ගණනාවකදී උපාධි ප්‍රදාන මහෝත්සව පැවැත්වීමට සැලසුම් කළ ද රටේ පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්විය හැකි කාලවකවානුව නිශ්චිත වශයෙන් ප්‍රකාශ කළ නොහැකි වී තිබේ. මේ හේතුවෙන් උපාධි සම්පූර්ණ කළ සිසුහු විශාල සංඛ්‍යාවක් උපාධි ප්‍රදානෝත්සව සඳහා සුදුසුකම් ලබා පොරොත්තු ලේඛන ගතව සිටිති.

උපාධි අපේක්ෂකයින් මුහුණපා ඇති ප්‍රධාන දුෂ්කරතා වන උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා ශිෂ්‍යත්ව අයදුම් කිරීම, දේශීය හා විදේශීය රැකියා සඳහා අයදුම් කිරීම, විදේශගත වීම වැනි හදිසි අවශ්‍යතා කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමු කර ඇත. එම අවශ්‍යතා ඇති උපාධි අපේක්ෂකයින්ගේ ඉල්ලීම මත " අනුපස්ථිතියෙහි" (නොපැමිණ - In absentia) උපාධි සහතිකය කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත.

"අනුපස්ථිතියෙහි"උපාධිය අයදුම් කර උපාධි සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කරන යම් උපාධි අපේක්ෂකයකු වේ නම් පහත වෙබ් ලිපිනය ඔස්සේ ඇතුළත් වී **එහි ඇති අයදුම් පත්‍රය 2021.06.15 දිනට පෙර සම්පූර්ණ කළ යුතු වේ.** එම අයදුම්කරුවන් සඳහා උපාධිය ප්‍රදානය කිරීම, සහතිකපත් නිකුත් කිරීම ආදී ඉදිරි තොරතුරු විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය මගින් හා අයදුම්පත්‍රවල සඳහන් කර ඇති විද්‍යුත් ලිපින ඔස්සේ අයදුම්කරුවන් හට පසුව දැනුම් දෙනු ලැබේ.

වෙබ් ලිපිනය : https://forms.gle/ReGFrPucfKF6UvXT8

**සැ.යු :**

- **සනාතන සභාව මගින් අවසන් ප්‍රතිඵල නිකුත් කර ඇති සිසුන් සඳහා පමණක් මෙය වලංගු වේ.**
- **"අනුපස්ථිතියෙහි" උපාධිය ප්‍රදානය කළ පසු නැවත "උපස්ථිතියෙහි" උපාධිය ප්‍රදානය කිරීමට අවසර දෙනු නොලැබේ.**
- **"අනුපස්ථිතියෙහි" උපාධිය අයදුම් කළ පසු එය අවසාන නිවේදනය වශයෙන් සලකන අතර නැවත එය සංශෝධනය කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.**
- **ඉහත දක්වා ඇති අවසන් දිනෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග
ලේඛකාධිකාරී වෙනුවට

***Tel: Senior Assistant Registrar:*** *011-2903111* ***Office:*** *011-2903112-4*
***Email:*** convocation@kln.ac.lk , officeexam@kln.ac.lk
***Web:*** https://administration.kln.ac.lk/exam/

**Examinations Division**
**University of Kelaniya**

Venerable Sirs , Dear Sir / Madam,

**Conferring the Degree "In-absentia"**

Even though the University has scheduled the convocations several times, it has become unpredictable to decide the dates of the convocation due to the prevailing covid 19 situation in the country. As a result of the same, there are many candidates to be graduated at convocations.

Continuous requests have been received from the students requesting the degree certificate in order to use the same for their higher education and migration purposes. Therefore, arrangements have been made to award the degree "in-absentia" as per the request/ consent of the candidates.

Hence, if you wish to obtain the degree "in-absentia", please fill the Google form through the following link to give your consent on or before **15.06.2021** for the same. The details pertaining to awarding the degree and issuance of the certificates will be informed later.

Web URL : https://forms.gle/ReGFrPucfKF6UvXT8

**Note:**

- **This is valid only for the final results already released from the senate.**
- **Once the degree is awarded "in-absentia", it is not allowed to participate for the convocation later " In – Persona"**
- **The request to obtain the degree certificate "in-absentia" will be considered as final and no changes will be allowed later.**
- **Requests received after the above deadline will not be considered.**

Senior Assistant Registrar / Examinations
For Registrar
University of Kelaniya

2021.05.11

***Tel: Senior Assistant Registrar:*** *011-2903111* ***Office:*** *011-2903112-4*
***Email:*** convocation@kln.ac.lk , officeexam@kln.ac.lk
***Web:*** *https://administration.kln.ac.lk/exam/*